2013-12-14 දින සිට 2014-12-14 දක්වා දියගල ළමා නගර

වාර්ෂික වාර්ථාව

සුභ උදෑසනක් ඔබ සැමට

තුරුවිල විමලධර්ම නායක ස්වාමින් වහන්සේගෙන් අවසරයි, ගරු පියතුමෙනි, ප්‍රාදේශීය අධිපති ගරු ඩෙන්සිල් පෙරේරා සහෝදරතුමෙනි, අප ආයතනයේ සභාපති තැන්පත් හෙන්රි දිසානායක සහෝදරතුමා ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලයේ මහතුනි ,විශේෂ ආරාධිත අමුත්තන් වන ගරු සුසත් නානායක්කාර සහෝදර තුමෙනි, ජ්ලැසිඩස් ප්‍රනාන්දු සහෝදර තුමා ඇතුළු සියළුම සහෝදරවරුනි, ගරු කන්‍යා සොහොයුරියෙනි, අද අප උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් මෙහි පැමිණ සිටින ජමීක්ක් ඒඒ ජරදාමජැරී ආයාතනයේ අධිපති තැන්පත් පිලිප් වේවිට මැතිතුමා හා එම මැතිණියෙනි, සියලුම ආරාධිත අමුත්තෙනි, අප ආයතනයේ කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරි මහත්ම මහත්මියනි, ආදරණීය මව්වරුණි, පියවරුණි, සහෝදරවරුණි, සහෝදරියනී, ආයතනයේ දරුවනී.

අද අප සියලු දෙනාට ඉතාමත් සුවිශේෂ දවසක්. අප ආයතනයේ වසර හතරක කාර්මික පුහුණුව සාර්ථකව නිම කර හඬු සහතිකයක් සමඟ රැකියාවක් ද අතැතිව නික්ම යන දරුවන්ට සුභ පැතීමටත් ඔවුන්ට හිමි සහතික පත්‍ර පිරිනැමීමටත් අද අප මේ සුදානම් වනුයේ. තම දරුවා අනාගතයට පුහුණු කාර්මික දැනුමක්ද සමඟ සමාජයට අවතීර්ණ වීමට දියගල ළමා නගරයෙන් සමුගෙන සමාජයට වැඩදායක පුද්ගලයෙකු වශයෙන් රැකියාව සඳහා විසිර යෑම අප සැමටම සතුටක් මෙන්ම ආඩම්බරයකි.

"ස්තුති පූර්වක හදින් අතීතය ආවර්ජනය කරන්න. ජීවලිතකමින් වර්තමානයේ ජීවත් වන්න. අධිෂ්ඨානශීලීව අනාගතය කරා පිය මනින්න." ශුද්ධෝත්තම 11 වන ජුවාම් පාවුළු පාප් තුමාගේ මෙවදන් අප ජීවිත ගමන හා යාවජීව කර ගනිමින් පුරා 52 වසරක ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන දියගල ළමා නගරයේ පසුගිය වසර පිළිබඳ අතීත ආවර්ජනය දිග හරින්නට, හෘදයාංගමව ඔබ සැමගෙන් අවසර පතමි.

"ආත්ම විශ්වාසයෙන් යුත් යොවුන් කැළක් : යහපත් ලොවක්" ලෙස අප ආදර්ශ පාඨය දිස් වෙද්දී, තරුණ පුතුණුවන්ගේ ජීවිත නවෝදයේ හිරු කිරණ දකින්නට අප ගත් වෑයම ප්‍රශංසනීයයි. ගොහොරු මඩින් මතුවී පිපෙන නෙළුමක් සේ, නව යෞවනයේ කොඳ මල් විකසිත කරන්නට අත්වැල් සැපයූ සැමට මාගේ කෘතවේදිත්වය පළමුව පුදමි. පවතින සමාජ, ආර්ථික, දේශපාලන, රාමුව තුළ ජීවිත අරමුණ බොඳවී මංමුලා වූවන්ටත්, අධ්‍යාපනයේ නිසි ඵල නෙලා ගැනීමට නොහැකි වූවන්ටත්, දුබල ආර්ථිකයෙන් හෙම්බත්වන

සෑම තරුණයෙක් වෙනුවෙන් දොර කවුළු පියන් විවර වූ දියගල ළමා නගරය වසර පනහක ඉතිහාසයකට හැම්කම් කියමින් දෙව්දු ආදරය තුළ, අභිමානවත්, නොනවතින ගමනක නිරත වන බව පවසන්නේ හද පිරී සතුටිනි.

තිස් වසරකට ආසන්න කාලයක් අප රට තුල පැවති කුරිරු යුද්ධයේ අවසානයත් සමඟ කඩිනමින් සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාව අපට පෙන්වා දිය හැක. අප රටේ ආර්ථිකයේ ක්‍රමවත් සංවර්ධනයක් සමගම රට තුල යටිතල පහසුකම් වලද සීග්‍ර වර්ධනයක් ඇතිවී ඇති බව අපට හොඳින් පෙනී යන කරුණකි. එසේ වුවද මෙම සංවර්ධන ක්‍රියාදාමය තුල තවමත් සැලකිය යුතු ජනතාවක් අන්ත දුගී දුප්පත් අසරණ බාවයෙන් දිවිගෙවක බවත් මොනවට පැහැදිලි වේ. ජනතාවගේ ආර්ථික සමාජ ප්‍රශ්න හේතුවෙන් සැලකිය යුතු දරුවන් ප්‍රමාණයක් පැසැල් අධ්‍යාපනය අතරමඟ කඩාකප්පල් කරගෙන රැකියා වෙළඳ පොලට අවතීර්ණ වන බව පෙනී යන කරුණකි. මෙම දරුවන් හට වෘත්තිය පුහුණුවක්ද නොමැති කමින් නොපුහුණු මානව සම්පතක් ලෙස ඔවුන් අප රට තුල පවතින ආර්ථික සමාජීය පරිහානියකටද ප්‍රධාන හේතුවක් බව අපට හොඳින් අවබෝධ වී ඇති සත්‍යතාවයකි.

එසේම රටතුල පවතින ආර්ථික සංවර්ධනයේ අසමතුලිතාවයත්, රටේ සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් අතලොස්සක්ගේ සුඛවිහරණයට නතුවීමත්, ක්‍රමවත් සැලසුමක් නොමැතිව සිදු කරන සංවර්ධන ක්‍රියාවලියත්, රටේ අවශ්‍යතාවන්ට අනුකූලව නිර්මානය කල යුතු අධ්‍යයාපන ක්‍රම වේදයක් නොමැතිවීමත් හේතුවෙන් ශ්‍රම වෙළඳ පොලට සරිලන ඉල්ලුමක් අප රටතුල නිර්මානය වී නැත.

ශ්‍රී ලංකාව දස අවුරුදු සංවර්ධන ඉලක්ක ලඟාකර ගනිමින් යන මේ මොහොතේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමය තුල පාසාල් හැර යන දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා කිසියම් හෝ වැඩ පිළිවෙලක් සකස් කිරිමට කාලය පැමිණ තිබේ. එසේ නොවුනහොත් අන්ත දිළිඳු පවුල්වල, යුද්ධය නිසා අවතැන් වු පවුල්වල පාසැල් හැර යන දරුවන් තව තවත් අන්ත දිළිඳුභාවයට පත්වී රටට බරක්වීම වැලකිය නොහැකි කරුණක් වනු නොඅනුමානය. කරුණු එසේ හෙයින් මෙලෙස පාසැල් හැර යන දරුවන්ට සුදුසු වෘත්තිය පුහුණු අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම යුගයේ අවශ්‍යතාවයක් වී ඇත.

මෙම තත්තවය මීට වසර ගනනාවකට කලින් තේරුම්ගත් ශාන්ත ජෝන් බැප්ටිස් ද ලාසාල් මුනිතුමා මෙවැනි දුගී දුප්පත් දරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා ආරම්භ කල අධ්‍යාපන ක්‍රමය ආදර්ශයට ගනිමින් දියගල ළමානගරය විසින් ආරම්භ කළ ශ්‍රී ලංකා තාක්ෂනික ආයතන පුරා වසර 52 ක් මෙරට දුගී දුප්පත් දරුවන්ට දෙපයින් නැගී සිටීමට ලබා දුන් සහය අද්විතීය වේ.

පනස් දෙවෙනි වසරටත් පා තබමින් හෙට ලොව දිනන්නට පාර තණන ළමා නගරය නව යෞවනයන්ගේ ජීවිත වෘතිමය අංශයෙන් පමණක් නොව සමාජීය හා අධ්‍යාත්මික අංශයන්ද ආවරණය කරමින්, දැනුම, ආකල්ප හා කුසලතා වලින් යුතු පූර්ණ නිපුණතාවයක් අත්කර දෙන්නට කැපවී සිටින්නෙමු. එම සත්කාර්යයට උර දෙන්නට මා හා අත්වැල් බැඳගන්නාවූ ප්‍රාදේශාධිපති සහෝදර තුමන් ඇතුළු අනෙකුත් සහෝදර තුමන්ලාටද, ගුරු මණ්ඩලයේ

සැමටද, නිබඳව අප හා සම්බන්ධ වන කාර්ය මණ්ඩලයේ සැමටද මාගේ කෘතවේදිත්වය නිහතමානීව පුදකරමි.

## අධ්‍යාත්මික නවෝදය

සමාජ සාරධර්ම හා මිනිස් වටිනාකම් වියැකෙමින් පවතින යුගයක දැනුම, ආකල්ප හා කුසලතා වලින් පමණක් නොව අධ්‍යාත්මික ගුණ වගාවෙන් හා අන්තර් ආගමික් සහජීවනයෙන් යුතු ප්‍රවසම්පන්න පුතුන් සමාජයට දායාද කිරීම සඳහා අප පසුගිය වසර පුරා දියත් කරන ලද අධ්‍යාත්මික හා පෝෂණ වැඩසටහන් මෙසේ පෙළගස්වමු.

- 2013 දෙසැම්බර් 22 වන දින නත්තල් උළෙල අර්ථාන්විතව පැවැත්වීම.
- හෙළ සිරිත් කුළුගන්වමින් චාරිත්‍රානුගත කිරි ඉතිරවීමේ වතාවත් තුළින් 2014 නව වසරට ආසිරි පැතිම.
- දේශීය සංස්කෘතික අංගයන්ගෙන් යුතුව මහ බ්‍රහස්පතින්දා, මහ සිකුරාදා සහ පාස්කු ඉරිදා දින විශේෂ දේව මෙහෙයන් පැවැත්වීම.
- 2014 මැයි මස 15 වන දින ළමා නගර සියළුම සහෝදරතුමන්ලාගේ හා සිසු දරුවන්ගේ සහභාගිත්වයෙන් ද ලාසාල් දිනය සමරනු ලැබීම.
- 2014 මැයි මස 30 වන දින මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය විසින් (ADIC) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හා ඉන් වැළකීම පිළිබඳ පෝෂණ වැඩසටහනක් පැවැත්වීම.
- පොසොන් පෝය නිමිති කර ගනිමින් ඉහළගම සුගතාරාමාධිපති ගරු නායක ස්වාමින්වහන්සේගේ ප්‍රධානත්වයෙන් මල් පහන් පූජාවක්ද, දන්සලක්ද, අලංකාර පොසොන් පහන් කූඩු ප්‍රදර්ශනයක්ද පැවැත්වීම.
- 2014 මාර්තු 02 වන දින දරුවන්ගේ ප්‍රගතිය හා දෙමාපියන්ගේ වගකීම් හා යුතුකම් පිළිබඳ මනෝ විද්‍යාත්මක දේශනයක් පැවැත්වීම. එලෙසම 2014 ජූලි මස 07 වන දින දෙමාපියන් හා දරුවන් වෙනුවෙන් නැවතත් වැඩසටහනක් සංවිධානය කිරීම.
- 2014 සැප්තැම්බර් මස 20 වන දින ධනාත්මක චින්තනයට අප හුරු විය යුත්තේ කෙසේද, එමගින් අපගේ ජීවිත දැක්ම පුළුල් වන්නේ කෙසේද යන මැයෙන් දේශනයක් පැවැත්වීම.

## වෘත්තීය මාර්ගෝපදේශය

නවීන තාක්ෂණය සීඝ්‍රයෙන් අප ගම්නියම් ගම් පසු කරන 21 වන ශතවර්ෂයේ එයට අනුගත වෙමින් ජීවිත අභියෝග ජය ගන්නට අප ආයතනය මඟින් විවිධ වෘත්තීමය මාර්ගෝපදේශයන් සිදු කරනු ලබයි. තරුණ පුතුන්ගේ විවිධ අධ්‍යාපනික මට්ටම්, හැකියා හා නිපුණතා ඉලක්ක කර ගනිමින් සැලසුම් කර ඇති එවැනි වෘත්තීමය පුහුණු අතර

- Toast Master International ආයතනය මඟින් ප්‍රායෝගික ඉංග්‍රීසි පන්තියක් ආරම්භ කිරීම.
- 2014 ජූලි මස 7 වන සිට 11 දින දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සුළු අපනයන භෝගයක් වන කුරුඳු වගාව පිළිබඳව පූර්ණ පාඨමාලාවක් පැවැත්වීම
- විදුලි පාඨමාලාව හගඪගුගු පාඨමාලාවක් බවට පත් කිරීම හා ඒ සඳහා බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- 2014.09.18 වන දින නුවරඑළිය 'නාසරෙත්'හෝටල් පාසලේ දෙවන අර්ධයේ පාඨ මාලාව ඇරඹීම.
- 2014 නොවැම්බර් මස 3 දින තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව මගින් වසර 4ක පුහුණුව සාර්ථකව නිමා කල පළමු ඇගයීම් පරීක්ෂණය පවත් වන ලදී.
- 2014 නොවැම්බර් මස 15,16 සහ 22 යන දිනවලදී තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් වසර 4ක පුහුණුව අවසන් කළ සිසුන්ගේ හගඪගු බැඩක 03 අධ්‍යාපන පරීක්ෂණය පැවැත් විම
- 2014 නොවැම්බර් මස 24,25,26 හා 27 දිනවලදී සිසුන්ගේ අවසන් වාර විභාගය පැවැත්වීම.

## ව්‍යායාමය සහ විවේකය

වෘත්තීය අධ්‍යාපනය, ආගමික හැදියාව හා ලැදියාව තාරුණ්‍යට නව පණක්, අරුතක් එක් කරද්දී සමබර සෞඛ්‍ය සම්පන්න පෞරුෂ වර්ධනයක් ඔවුන් තුළ ඇතිකිරීම සඳහා අපි උනන්දු වූයෙමු . ක්‍රීඩා කටයුතු,විනෝද චාරිකා සංවිධානය මගින් එකී සමබර පෞරුෂ වර්ධනය සඳහා අවශ්‍ය ආත්ම විශ්වාසය, හික්මවීම, විවේකය හා සැහැල්ලුබව රුක්ංඑසදබ ලබා දීමට අපි මෙලෙස කටයුතු කළෙමු.

- 2014.10.01 දින ලෝක ළමා දිනය නිමිති කර ගනිමින් නිවාසාන්තර පාපන්දු තරඟයක් පැවැත්වීම.

- 2014.10.06 ජාත්‍යාන්තර ගුරු දිනය නිමිත්තෙන් ගුරු භවතුන් හා සිසුන් අතර සුහඳ ක්‍රිකට් තරඟ යක් පැවැත්වීම.
- 2014.11.01 දින අධ්‍යාපන මෙන්ම විනෝද චාරිකාවක නිරත වීම.
- 2014.11.29 දින පුහුණුව ලබා විසිර යාමට නියමිත සිසුන් වෙනුවෙන් විනෝද චාරිකාවක් සංවිධානය කිරීම.

## විශේෂ සිදුවීම්

2013 -2014 වසර දෙකක කාලය පුරාවට අප ආයතන කැලැන්ඩරයේ සිදුවූ අනුස්මරණීය සිදුවීම් පිළිබඳ මතකයන් ඔබ සැම ඉදිරියේ මෙසේ සිහිකැඳවමු.

- 2014 ජනවාරි මස 06 වන දින නේවාසිකාගාරයේ ප්‍රධානියා වශයෙන් වෙනිස් මාරසිංහ සහෝදර තුමාගේ සම්ප්‍රාප්තිය හා එතෙක් සේවය කරමින් සිටි රොෂාන් ඩයස් සහෝදරතුමා කුරුණෑගල සා/ආනා විදුහලේ සේවය සඳහා නික්මයාම.
- 2014 පෙබරවාරි මස දියගල ළමා නගර සංකීර්ණයේ සභාපති ගරු හෙන්රි දිසානායක සහෝදරතුමාගේ උපන්දිනය සැමරීම.
- 2014 අප්‍රේල් මස දින හෙන්රි දිසානායක සහෝදරතුමා රෝමයේ පැවති 45 වන ලසාලියානු මහ සමුළුවට සහභාගි වීම සඳහා රෝමය බලා පිටත් වීම.
- 2014 අප්‍රේල් මස 30 වන දින දියගල ළමා නගර දිනය උත්සවශ්‍රීයෙන් පැවැත්වීම.
- 2014 මැයි මස 2 දින දියගල ළමා නගර සංකීර්ණයේ මානව සම්පත් කළමණාකාර ධූරයට R.D.P. ගාමිණී මහතා පත්වීම ලැබීම
- 2014 මැයි මස 4 දින දියගල ළමා නගර නිර්මාතෘ ගරු හර්මන්පිල් ජෝශප් සහෝදර තුමාගේ පිළිරුවක් නිරාවරණය කිරීම හා පුෂ්පෝපහාර දැක්වීම. මෙහිදී විශේෂයෙන් එම ප්‍රතිමාව ඉතාම අලංකාර ලෙෂ නිමවා දුන් සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සරත් මල්දෙනිය මහතාව අප ප්‍රශංශාත්මකව හා ස්තූති පූර්වකව සිහිපත් කරමු.
- 2014 සැප්තැම්බර් මස 15 වන දින අප ආයතනයේ සේවය සඳහා ගරු ලුසිඩා ප්‍රනාන්දු පැව්දි සොයුරිය පැමිණීම.
- 2014.10.06 වන දින ජාත්‍යන්තර ගුරු දිනය නිමිති කරගෙන ගුරු උපහාර වන්දනාමය වැඩසටහන පැවැත්වීම.

## තුති මල් මිටක්

වසරින් වසර අප පසු කරන නික්මයාමේ ගමන තුළ විටෙක වළා ටැඹක් ලෙසද, විටෙක ගිණි ටැඹක් ලෙසද, අප හා ගමන් කරන්නාවූ මහෝත්තම දෙව්පියාණන්ට අපගේ ස්තුතිය හා ප්‍රශංසාව පුද කරමු.

වසර 4ක පුහුණු පාඨමාලා හදාරා හෙට දවසේ මහඟු සමාජ මෙහෙවරකට දායකත්වය සැපයීම තුලින් ජීවිත ගමනේ සරු ඵල නෙලාගන්නට මේ තරුණ පුතුන්ට පන්නරයක්ම වූ රජයේ සහ පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන හා එහි කාර්යය මණ්ඩලවල සියලුම නිළධාරීන්ට මේ මහඟු සත්ක්‍රියාව සාර්ථක කර ගැනීම සඳහා අප හා අත්වැල් බැඳගැනීම නිමිත්තෙන් අප ආයතනයේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමු. වසර 4ක පුහුණුව නිමාකල අපගේ දරුවන්ට රැකියා අවස්ථා සලසා දී තිබෙන ඒදිරිසිංහ සහෝදර සමාගම, ශ්‍රී ලංකා යුධ හමුදාව, සොලෙක්ස්, හේලීස් සමූහ ව්‍යාපාරය වැනි දිවයිනේ ප්‍රසිද්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලට අපගේ ගෞරව පූර්වක ස්තුතිය.

දියගල ළමා නගරයේ හා දරුවන්ගේ ඉදිරි අනාගතයට සවියක් වනු සඳහා පරිත්‍යාගශීලී දෑත් අපවෙත දිගුකළ ආයතන හා එහි නිළධාරී මණ්ඩලයද අපගේ හදවතින් නැගෙන ස්තූතිය මෙලෙස පිළිගන්වා සිටිමු . විශේෂයෙන් 2014 ජුනි මාසයේ 15 වන දින දවස පුරා මහ ශ්‍රමදාන කඳවුරක් පවත්වමින් දරුවන්ගේ ඩෙස්ක්, පුටු , මුලුතැන් ගෙය සහ කෑම කාමරය අලංකාරව සකසා දෙමින් ප්‍රණීත ආහාර වේලක් ද සැපයූ ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුවේ කාර්යය මණ්ඩලයේ සහයෝගය අගය කොට සලකමු .

මෙම වසරේ අවසාන ----------------- විභාගයෙන් සමත් වී රැකියා අවස්ථා ලබා තරුණ පුතුන් ---------- දෙනෙකු මෙම ආයතනයෙන් පිටවී යන බව පවසන්නේ ආඩම්භරයෙනි. මොවුන්ට රැකියා අවස්ථා ලබා දෙමින් මොවුන් දිවි මඟ පැහැසර කළ පහත සඳහන් ආයතන ප්‍රධානීන්ට අපගේ ස්තූතිය හිමි වන්නේ නිරායාසයෙනි.

1. රොෂාන් ඉන්ඩස්ට්‍රීස් ආයතනය - දන්කොටුව

2. ජ්ලින්ත් ඉන්ඩස්ට්‍රීස් පාක් ආයතනය - කටුනායක

3. ලහිරු ඉංජිනිරින් වර්ක්ස් - සිදූව

4. වාෂිඉවී (ඕියැඩස * ඉංජිනියර්ස් - හෝමාගම

5. මීචාමර කොචරන් ලංකා සමගාම - වත්තල

6. කිතුල් කන්ද රෙසෝට් - පාදුක්ක

7. ගාමිණී පෙට් ෂොප් - ජා-ඇල

8. ඕෂධ ටෙක්නිකල් වර්ක්ස් - රාගම

අප ආයතනය සමඟ ඉතාමත් සුහදශීලි එකමුතු කමකින් කටයුතු කරන අප ආයතනයේ පොදු කටයුතුවලදී අපට මහත් සහයෝගයක් ලබා දෙන තුරුවල විමලධර්ම නායක හිමිපාණන්ට අපගේ හද පිරි ස්තුය පුද කිරීමට කැමැත්තෙමි.

විශේෂයෙන් ආයතන ප්‍රධානියෙකු වශයෙන් රාජකාරි දහසක් අතර විවේකයක් ලබාගතහැකි දිනය වන ඉරුදින අප වෙනුවෙන් කැප කර අද අපේ උත්සවයට පැමිණීම අපට කරන ලද ගෞරවයකි. මෙතුමා අපගේ හිතවතෙකු වන අතරම ද මැසනඩ් විදුහලේ ආදි ශිෂ්‍යයෙක් බවත් මම ආඩම්බරයෙන් කියන්න කැමතියි. ඔබගේ පැමිණීම තුලින් අපට දැක්වූ ඒ ශක්තිය අප අගය කරන අතරම, පුස්සැල්ලෑම මීට් ප්‍රොඩක්ෂන් ආයතනයේ සභාපති තැන්පත් පිලිප් වේවිට මහතාට හා එම මැතිනියට අපගේ ගෞරවාදර ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු.

පසුගිය වසර පුරාවටම අප සමඟ සිටිමින් අධ්‍යාත්මකව අපව පෝෂණය කරමින්, අප සැමට දහමේ වටිනාකම පහදා දෙමින්, අපගේ ආගමික කටයුතු වලදී පුරොගිමිව කටයුතු කළ ගරු ප්ලීෂියන් පියතුමාට අපගේ ස්තුතිය පුද කරමු.

ද ලසාලියන් නිකායට නායකත්වය දෙමින් ද ලාසාල් මුනිතුමාගේ මෙහෙවර ඉදිරියට ගෙන යැමට ඇප කැපවෙමින් අපට ලබා දුන් ඒ මහඟු නායකත්වයට ප්‍රාදේශිය අධිපති තැන්පත් ඩෙන්සිල් පෙරේරා සහෝදරතුමාට අපගේ ආදර ස්තුතිය.

වසර පහක කාලයක් අපට නායකත්ව දෙමින්, ගුරු හරුකම් ලබා දෙමින්, අප ආයතනයේ සුභ සිද්ධිය වෙනුවෙන් කාලයත් ශ්‍රමයත් කැප කළ අප ආයතනයේ සභාපති තැන්පත් ගරු හෙන්රි දිසානායක සහෝදරතුමාට අපගේ හද පිරි ස්තුතිය පුද කරමු. එසේම අප උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තන් වශයෙන් පැමිණ සිටින ගරු සුතත් නානායක්කාර සහොදරතුමාටත්, ගරු ප්ලැසිඩස් ප්‍රනාන්දු සහෝදරතුමාටත් අපගේ ස්තුතිය පිරි නැමීමට කැමැත්තෙමි.

දිවා රෑ නොබලා අප ආයතනයේ සෙවන ලබන දරුවන්ව ආදරයෙන් රැක බලා ගනිමින් හොඳ නරක කියා දෙමින්, මුලු කාලයම කැප කළ ගරු ඩෙනිස් මාරසිංහ සහෝදරතුමාට අපගේ හදපිරි ස්තුතිය පුද කරමු.

දුකක්, කරදරයක්, අසනීපයක් විතරක් නොව අනෙකුත් සැම කටයුත්තකදිම ඔබත් මුලිකත්වය ගෙන කටයුතු කලා. එය අපේ ගමන විශාල පිටුවහලක් වුනා. ගරු ලුසිඩා කන්‍යා සොහොයුරියට අපගේ හදපිරි ස්තුතිය පුද කරමු. එසේම අප ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සියළුම සාමාජික සාමාජිකාවන්ටද අපගේ හද පිරි ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු.

ඊලගට මා ස්තුති කිරීමට බලාපොරොත්තු වන්නේ අප ආයතනයේ ප්‍රබල ශක්තිය වන කළමණාකරණ මණ්ඩලය හා ආචාර්ය මණ්ඩලය ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයටයි. ඔබලාගෙන් මෙම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට පමණක් නොවේ සැම කටයුත්තකදිම ඔබගෙන් ලද සහය අති මහත්ය. ඔබ

නොසිටින්ට මෙම දරුවන්ගේ ඥාන ගුණයෙන් පිරි පිරිසක් බිහි කිරීමට නොහැකි වනු ඇත.එම කර්තව්‍ය වෙනුවෙන් ඔබ කළ මෙහෙයට මාගේ බලවත් ස්තූතිය පුද කරමි.

අප ආයතනයට අදාල නීතිමය කටයුතුවලදී අපට මහත් සහයක් ලබා දෙන නීතිඥ වර්නන් කුරෝ මහතාටත් බර්නි අලුවිස් මහත්මියටත් හියුගෝ ඇන්තිනි මහතාටත් අපගේ ස්තූතිය මෙයින් පුද කරමි.

මා හිතවත් දෙමාපියෙනි, ඔබ විසින් ඔබගේ දරුවා මෙම ආයතනයට ඇතුලත් කිරීම සඳහා ගත් ඒ ශ්‍රද්ධානාන්විත තීරණය පිළිබඳව අප බෙහෙවින් ප්‍රසන්නවෙමි. නොයෙකුත් ආර්ථික අපහසුකම් මධ්‍යයේ වුවද ඔබ කළ ඒ මහැඟි කැප කිරීමට අප ගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

එමෙන්ම අප ආයතනයේ ඉගෙනුම ලබන දරුවෙනි. ඔබ නොමැතිනම් මෙහි අරමුණක් නොමැති වනු ඇත. අපගේ ගුරුහරු කම් මත ඔබ සමාජයට හොඳ පුද්ගලයෙකු වනු දැකිම අපගේ එකම අරමුණයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනිම සඳහා ඔබ දක්වන සහයට මම ස්තූති වන්ත වෙමි.

එසේම...

- ✓ කැනඩාවේ ජෝන් කැසීස් මහතාට
- ✓ ඕස්ට්‍රේලියාවේ ශාන්ත බ්‍රජට් ආදි ශිෂ්‍යාවන්ගේ සංගමයට
- ✓ ස්විස්ටර්ලන්ත කාන්තා සංගමයට ( ස්විස්ටර්ලන්තය )
- ✓ අධ්‍යක්ෂ මණ්ඩලයේ වසර ගණනාවක් සාමාජිකයකු වශයෙන් සේවය කළ ආචාර්ය ෆ්‍රෑන්ක් නිරංජන් මහතාට
- ✓ නුවර එළිය භාරව කටයුතු කරන ගරු නොයෙල් පෙරේරා සහෝදර තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටද
- ✓ මාවතගම දෙල්ගොල්ල ආයතනය භාරව කටයුතු කරන ගරු පිලිප් සහෝදර තුමාට
- ✓ කොටහේන ශාඛාව භාරව  කටයුතු කරන නිත්‍යානාදන් මහතාට
- ✓ ළමා සුරැකුම් මධ්‍යස්ථානයට මූල්‍යමය ප්‍රතිපාදන සපයන සිංහ සමාජයේ සියළුම සාමාජික / සාමාජිකාවන්ට
- ✓ ළමා සුරැකුම් මධ්‍යස්ථානය භාර ඇන්ටන් ගුණතිලක ගරු සහෝදර තුමා ඇතුලු කාර්ය මණ්ඩලයට සහ අවසාන වශයෙන්,

දියගල ළමා සමාජයට නන් අයුරින් සහය දෙන සියළුම දෙනාටත්, අපට හදවතින්ම සුභ පතන්නන්ටත් අද දින උත්සවයට සපැමිණි සියළුම ආරාධිත අමුත්තන් ඇතුලු සියළුම දෙනාටත් මාගේ ආදරණීය ස්තූතිය හද පත්ලෙන්ම පිරිනමමි.

ස්තූතියි ෟ